මහනුවර යුගයේ දෙල්දෙණිය සිත්තර පරපුරට අනන්‍ය වූ සිතුවම් කලාව පිළිබඳ සූරියගොඩ රජමහා විහාරයේ ප්‍රතිමා ගෘහය ඇසුරෙන් කළ අධ්‍යයනයක්

අයි.ජී.එච්.ටී. මදුමාදරී [1] , කේ.ඕ.ඒ.එස්.බී. අබේසේකර [2]

ශ්‍රී ලංකා ඉතිහාසය තුළ පෞරාණිකත්වය හා දේශීය සාම්ප්‍රදායිකත්වය ඉස්මතු කෙරෙන පුරාණ විහාරස්ථානයක් ලෙස සූරියගොඩ නරේන්ද්‍රසිංහ රජමහා විහාරස්ථානය හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟ පළාත සූරියගොඩ ග්‍රාම නිලධාරී වසම තුළ සියලු විහාරාංගයන්ගෙන් පරිපූර්ණ ව මහනුවර යුගයේ කලා සම්ප්‍රදායයන් අනුව නිමවා ඇති ඓතිහාසික සූරියගොඩ රජමහා විහාරය පිහිටා ඇත. විහාරස්ථානයේ ඉතිහාසය කෝට්ටේ යුගය දක්වා දිව යන අතර ක්‍රිස්තු වර්ෂ 1757 දි මහනුවර රාජධානියේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මූලිකත්වයෙන් ද, වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ හිමිගේ අනුශාසකත්වයෙන් ද ප්‍රතිසංස්කරණය කොට ඇත. පර්යේෂණ ගැටලුව වන්නේ සූරියගොඩ රජමහා විහාරයේ ප්‍රතිමා ගෘහය තුළ විද්‍යාමාන දෙල්දෙණිය සිත්තර පරපුරේ සිතුවම්කරණයට ආවේණික ලක්ෂණ කෙබඳු ද යන්න පිළිබඳව යි. සූරියගොඩ රජමහා විහාරයේ ප්‍රතිමා ගෘහය ඇතුළත දෙල්දෙණිය සිත්තර පරපුරට අනන්‍ය වූ සිතුවම් කලාව පිළිබඳ සිදු කළ මෙම පර්යේෂණයේ අධ්‍යයන අරමුණ වන්නේ සූරියගොඩ රජමහා විහාරය ඇසුරෙන් දෙල්දෙණිය සිත්තර පරපුරේ සිතුවම් කලාවට අනන්‍ය වූ ලක්ෂණ හඳුනා ගනිමින් සූරියගොඩ රජමහා විහාරය ජාතික උරුමයක් ලෙස වැදගත් වන බවත්, එය සංරක්ෂණය කිරීමේ වගකීම සමාජයට අවධාරණය කිරීම යි. ක්ෂේත්‍ර අධ්‍යයන සහ ග්‍රන්ථ විශ්ලේෂණ ක්‍රම යන පර්යේෂණ ක්‍රමවේද යටතේ රාජමහා විහාරය පිළිබඳ සිදුකරන ලද මෙම පර්යේෂණයෙන් ලබාගත් සොයාගැනීම් අනුව දෙල්දෙණිය සිත්තර පරම්පරාවට අනන්‍ය වූ ලක්ෂණ ලෙස, මෙම සිතුවම්හි බාහිර රේඛාකරණය දක්නට ලැබුණත් මහනුවර යුගයේ අනෙකුත් විහාරස්ථානවල සිතුවම්හි මිනිස් රූපවල දක්නට ඇති සියුම් රේඛාකරණය මෙහි දී දක්නට ඇත්තේ අල්ප වසයෙනි. මූලික වසයෙන් රතු, සුදු, කහ සහ නිල් වර්ණ භාවිත කොට ඇත. කොළ වර්ණය භාවිත නොකිරීම මෙම සිතුවම්කරණයට අනන්‍ය වූ ලක්ෂණයකි. මහනුවර යුගය තුළ අනෙකුත් විහාරස්ථානවල දක්නට නොලැබෙන ජීව ස්වරූපයක් දක්නට ඇත. එනම් මානව රූපවල අත්-පා චලනය වන ස්වරූපයක් දක්නට ඇත. මහනුවර යුගයේ අනෙක් සිත්තරුන් සත්ව රූප හා මානව රූපවලට එක ම උසකට ශෛලගත ස්වරූපයක් ලබා දී ඇත. නමුත් මොවුන් මිනිස් රූපවලට වඩා සත්ව රූප විශාල ව ඇඳ ස්වභාවිකත්වයට මුල් තැනක් ලබා දී ඇත. මහනුවර යුගයේ ශාක ඇඳීමේ දී පත්‍ර හා අතු වෙන් වෙන් වසයෙන් ඇඳ බාහිර රේඛණය කර තිබුණ ත්, පින්සල් පාරවලින් ශාක ඇඳ තිබීම නූතනවාදී සිත්තරුන් භාවිත කරන තාක්ෂණික ක්‍රමවේදයක් ලෙස හඳුනාගත හැකි ය. සිතුවම් සම්පීඩනයේ දී මොවුන් පසුබිම වැඩි වසයෙන් හිස් ව තැබීම නිසා එය මහනුවර යුගයේ අනෙක් සිත්තරන් සමග සැසඳීමේ දී මොවුන් සතු ප්‍රබල දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකි ය. පර්යේෂණ අධ්‍යයනයට අනුව පෙනීගිය කරුණ නම් දෙල්දෙණිය සිත්තර පරපුරේ චිත්‍ර ශෛලියෙහි සිතුවම් දැකිය හැකි එකම ස්ථානය සූරියගොඩ රජමහා විහාරය වන බව යි. මහනුවර යුගයේ අනෙකුත් බෞද්ධ විහාරස්ථානයන් හි දක්නට ඇති චිත්‍ර සමග සූරියගොඩ විහාරස්ථානයේ ඇති සිතුවම් සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීම දුෂ්කර වන බව මෙ මගින් නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ දෙල්දෙණිය සිත්තර පරපුර, මහනුවර යුගය, විහාරස්ථානය, සිතුවම්කරණය, සූරියගොඩ රජමහා විහාරය

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. hhiru1223@gmail.com
[2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. anupamaabeyasekara318@gmail.com